රංගනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 2025/**Certificate in Acting Programme 2025**

ලංකා ළමා හා යවුවන රඟහල පදනම (Lanka Children's and Youth Theatre Foundation) 1981 දී සෝමලතා සුබසිංහ විසින් ආරම්භ කරන ලද ලංකා ළමා හා යොවුන් රඟහල පදනම (LCYTF) විශේෂයෙන් ළමුන් සහ තරුණයින් සඳහා වූ නාට්‍ය නිෂ්පාදන සහ ප්‍රසංග ප්‍රවර්ධනය කරයි. එහි නාට්‍ය නිෂ්පාදන සහ පුහුණු අංශය වන සෝමලතා සුබසිංහ ප්ලේ හවුස් සමඟින්, එය රංගන ශිල්පීන් පුහුණු කිරීම සහ නාට්‍ය අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ සඳහා ද සම්බන්ධ වේ. 1981 වර්ෂයේ ආරම්භයේ සිට මෙම ආයතනය ළමා හා තරුණයන් සඳහා නාට්‍ය නිර්මාණ රැසක් නිෂ්පාදනය කර ඇති අතර ඒවායින් බොහොමයක් සංගීත නාට්‍ය ගණයට අයත් වන අතර දිවයිනේ මෙන්ම විදේශයන්හි ද රඟදැක්වෙන සම්මානලාභී ප්‍රධාන ධාරාවේ නාට්‍ය ද නිර්මාණය කර ඇත. 2007 ජනවාරි මාසයේදී මෙම ආයතනය 2007 අංක 3 දරණ පනත යටතේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංස්ථාපිත කරන ලදී. මේ වන විට LCYTF යනු ශ්‍රී ලංකා වේ ළමා හා යොවුන් නාට්‍ය නිෂ්පාදන සඳහා වන ප්‍රමුඛතම ආයතනයයි.

හැඳින්වීම:

වැඩසටහනේ පරමාර්ථය වන්නේ සහභාගිවන්නන්ට රංගනය, අධ්‍යක්ෂණය, පිටපත් රචනය සහ නර්තන/සංගීත නාට්‍ය පිළිබඳ මූලිකඅවබෝධය සහ පුහුණුව ලබා දීමයි. එබැවින්, මෙම වැඩසටහන මඟින් වේදිකා වේ, රූපවාහිනිය සහ සිනමා ව රංගනය, තිර රචනය සහ විශ්ලේෂණය, අධ්‍යක්ෂණය, චලනය සහ වාචික පුහුණුව ඇතුළු සියලු අංග පිළිබඳ පුහුණුව ලබා දේ. සහභාගිවන්නන්ට නිදහස් හා ව්‍යුහගත චලනයන් සහ ඉරියව්, ශරීරයේ නම්‍යශීලී බව සහ ශාරීරික සමතුලිතතාවය, වාචික පුහුණුව, උච්චාරණය, කටහඬ ප්‍රක්ෂේපණය වැඩිදියුණු කිරීම සහ දර්ශන සකස්කිරීම ආදිය ඉගෙන ගැනීමට අවස්ථාව ලැබේ.

කා සඳහාද?

වයස අවුරුදු 17 සහ ඊට වැඩි පුද්ගලයින් සඳහා විවෘතය. අයදුම්කරුවන්ට නාට්‍ය රංගනය සඳහා ආශාවක් සහ පුහුණුව සඳහා සම්පූර්ණයෙන්ම කැපවීමට කැමැත්තක් තිබිය යුතුය. අභිලාෂය සහ කැපවීම අපේක්ෂකයින් තුළ අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ගුණාංග වන අතර, ඔවුන් ඔන්ලයින් හෝ හමුවී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ හරහා තෝරා ගනු ලැබේ.

ඉගෙනීමේ ප්‍රතිඵල:

මෙම වැඩසටහනට සහභාගිවන්නන්ට පහත සඳහන් මූලික කරුණු ඉගෙන ගැනීමට අවස්ථා ව ලබා දෙයි.

(i) වේදිකාව, රූපවාහිණිය සහ සිනමාව සඳහා රංගනය (ii) නැටුම් සහ නිදහස් හා ව්‍යුහගත චලනයන්, (iii) පිටපත සහ චරිත විශ්ලේෂණය, (iv) දර්ශන නිර්මාණය සහ සංවර්ධනය, (v) වාචික පුහුණුව, හඬ ප්‍රක්ෂේපණය, උච්චා රණය සහ, (vi) ක්ෂණික රංගනය.

සම්පත් දායකයින්:

මෙම වැඩසටහන මූලික වශයෙන් මෙහෙයවනු ලබන්නේ කෞශල්‍යා ප්‍රනාන්දු විසිනි. කෞශල්‍යා ප්‍රනාන්දු රංගනය සහ නළු පුහුණුව පිළිබඳව ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් ලබා ඇති අතර ඇයගේ සිනමා රංගනය ජාත්‍යන්තර සම්මානයට සහ ප්‍රශංසා වට පාත්‍ර වී ඇත. මීට අමතරව ප්‍රසන්න මහගමගේ, මයුර පෙරේරා සහ තිලංක දහනායක රංගනය, අධ්‍යක්ෂණය සහ තිර රචනය විශ්ලේෂණය සහ සංවර්ධනය පිළිබඳ සම්පත් දායකයන් වේ. ඔවුන් සියලු දෙනා ම නළු පුහුණුව පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ලබා ඇත. චන්දන අලුත්ගේ විසින් ව්‍යුහගත සහ නිදහස් චලනයන් සහ හඬ ප්‍රක්ෂේපණය පිළිබඳ සැසි පවත්වන අතර කැමරා වට රංගනය පිළිබඳ පුහුණුව

නැඟී එන තරුණ චිත්‍රපට අධ්‍යක්ෂ සහ තිර පිටපත් රචක තිසර ඉඹුලාන විසින් මෙහෙයවනු ලැබේ. මීට අමතරව, විශේෂිත ක්ෂේත්‍රවල අනෙකුත් වෘත්තීය කලාකරුවන් ද සැසි පවත්වනු ඇත.

කාලසීමාව, වේලාව සහ අයකිරීම:
වැඩසටහනේ කාලය මාස අටකි. කාල සීමාව තුළ, සැසි තිස් දෙකක් සතිපතා පවත්වනු ලැබේ. පන්ති සාමාන්‍යයෙන් ඉරිදා දිනවල උදේ 8.30 සිට සවස 5.30 දක්වා පැවැත්වේ. කෙසේවෙතත් සහභාගිවන්නන්ගේ පහසුව අනුව, අවශ්‍ය විට රජයේ නිවාඩු දිනවල ද පන්ති පැවැත්වීමට හැකිය. මෙම වැඩසටහන වාර්ෂිකව පවත්වනු ලබන අතර සෑම වසරකම ජනවාරි පළමු/දෙවන සතියේදී ආරම්භ වේ. පුහුණු සැසිවලට සහභාගිවීම සඳහා තමන්ගේම ආහාර පාන සහ සුදුසු ඇඳුම් රැගෙන එන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටී.

වැඩසටහන සඳහා ගාස්තුව සහභාගිවන්නෙකුට රු.70,000/= කි. සම්පූර්ණ ගාස්තුව ලියා පදිංචියේදී ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මූල්‍ය දුෂ්කරතා ඇති අයට ලියා පදිංචියේදී රු. 50,000/= ක් ගෙවිය හැකි අතර ඉතිරි මුදල වැඩසටහනේ පළමු මාස දෙක තුළ සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය. සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ගෙවා ඇති සහ වැඩසටහනට අකණ්ඩව සහභාගී වී ඇති අයට පමණක් ලංකා ළමා හා යොවුන් රඟහල පදනමේ සහතිකය සඳහා හිමිකම් ඇත්තේය.

ස්ථානය:
බත්තරමුල්ල ජයන්තිපුර ප්‍රධාන පාරේ පිහිටි සිංහ සමාජ ශාලාවේදී සැසි පැවැත්වේ.